# සංඛ්‍යා එකතු කිරීමේ ගැටලු විසඳීම



## දෙමාපියන්ට උපදෙස්

## සපයාගත යුතු දේ -

- කොටු 100 ක සැලැස්ම 9 ක්
- කොටු 10 ක කඩදාසි පටි 9 ක්
- වෙන් වෙන්ව සකසා ගත් කුඩා කොටු සහිත කාඩ්පත් 9 ක්
  (ගණිතය පෙළපොතෙහි පිටු අංක 49 හි සඳහන් ආකාරයට, කඩදාසි කොළවල සකස් කර සනකම් කාඩ්බෝඩ්වල හෝ ලී කුට්ටිවල අලවා ගන්න)
- 0 සිට 9 තෙක් ලියූ සංඛ්‍යාපත් කට්ටල 2 ක්

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |

- 

| **සියයේ ඒවා** | **දහයේ ඒවා** | **එකේ ඒවා** |
|---|---|---|
| | | |

  ලෙස විශාලව සකසා ගත් පත්‍රිකාවක්

- පහත සංඛ්‍යා ලියූ කාඩ්පත්

| | | | |
|---|---|---|---|
| 327 | 58 | 532 | 228 |

## ක්‍රියාකාරකම 01

- සංඛ්‍යා එකතු කිරීම පිළිබඳව සරල ප්‍රශ්න කිහිපයක් දරුවාගෙන් විමසන්න. පිළිතුරු ලබාගන්න.
  - 10 ට 7 ක් එකතු කළ විට කීය ද ?
  - 20 ට 5 ක් එකතු කළ විට කීය ද ?
  - 25 ට 8 ක් එකතු කළ විට කීය ද ?
  - 
- 325 + 112 හි පිළිතුර ලබා ගැනීමට කළ යුතු දේ පත්‍රිකාව ඇසුරෙන් දරුවාට පැහැදිලි කරන්න.

| සියයේ ඒවා | දහයේ ඒවා | එකේ ඒවා |
|---|---|---|
| | | |

- පළමුව 325 සංඛ්‍යාව ඉහත පත්‍රිකාවේ නිරූපණය කළ යුතු බව දරුවාට පවසන්න.
- 325 සංඛ්‍යාවේ සියයේ ඒවා 3 ක් තිබෙන බව පැහැදිලි කර 300 නිරූපණය කිරීමට, සියයේ කොටු සැලැස්ම 3 ක් තැබිය යුතු බව දරුවාට පහදා දෙන්න.
- සියයේ ඒවා තීරයෙහි එම කොටු සැලැසුම් තැබීමට දරුවාට කියන්න.
- 325 සංඛ්‍යාවේ දහයේ ඒවා 2 ක් තිබෙන බව පැහැදිලි කර (20) එය නිරූපණය කිරීම සඳහා කොටු 10 කඩදාසි පටි 2 ක් දහයේ ඒවා තීරයේ තැබීමට කියන්න.
- 325 සංඛ්‍යාවේ එකේ ඒවා 5 ක් තිබෙන බව පැහැදිලි කර එය නිරූපණය කිරීමට කුඩා කොටු සහිත කාඩ්පත් 5 එකේ ඒවා තීරයෙහි තැබීමට දරුවාට කියන්න.
- ඉහත පත්‍රිකාවෙහි 325 සංඛ්‍යාව නිරූපණය කළ ආකාරය දරුවාට කිහිපවරක් පහදා දෙන්න.
- 325 සංඛ්‍යාවට එකතු කළ යුතු අනෙක් සංඛ්‍යාව (112) පෙර තැබූ පරිදි, සියයේ ඒවා, දහයේ ඒවා, එකේ ඒවා තීරුවල තැබීමට දරුවාට කියන්න..
- එක් එක් තීරු පහළට එකතු කර පිළිතුරු ලබාගැනීම සඳහා පළමුව එකේ ඒවා තීරුවෙහි සඳහන් කාඩ්පත් එකතු කිරීමට දරුවාට අවස්ථාව දෙන්න.
- ඉන්පසු දහයේ ඒවා තීරුව එකතු කිරීමට ද අවසානයේ සියයේ ඒවා එකතු කිරීමට ද කියන්න..
- පිළිතුර දරුවාගෙන් විමසන්න. පිළිතුර ලබාගත් ආකාරය නැවත පැහැදිලි කරන්න.

## ක්‍රියාකාරකම 02

- 325 + 112 සංඛ්‍යාවේ පිළිතුර පහත ආකාරයට ද ලබා ගත හැකි බව දරුවාට පවසන්න.
- පත්‍රිකාව මේසය මත තබා 325 සංඛ්‍යාව සංඛ්‍යාපත් ඇසුරෙන් නිරූපණය කිරීමට දරුවාට අවස්ථාව ලබා දෙන්න.

| සියයේ ඒවා | දහයේ ඒවා | එකේ ඒවා |
|---|---|---|
| 3 | 2 | 5 |

- ස්ථානීය අගය අනුව කාඩ්පත් නිවැරදි ස්ථානයේ තබන්නේදැ යි බලන්න.
- 325 ට එකතු කළ යුතු 112 සංඛ්‍යාවට අදාළ සංඛ්‍යා කාඩ්පත් තෝරා ගැනීමට දරුවාට අවස්ථාව ලබාදෙන්න.
- පෙර තැබූ සංඛ්‍යාපත් යටින් නිවැරදි ස්ථානයේ එම කාඩ්පත් තැබීමට දරුවාට කියන්න.
- පළමුව එකේ ඒවා තීරුව ද දෙවනුව දහයේ ඒවා තීරුව ද අවසානයේ සියයේ ඒවා තීරුව ද එකතු කර පිළිතුර ලබා ගැනීමට දරුවාට අවස්ථාව ලබාදෙන්න.
- පිළිතුර ලබාගත් ආකාරය පියවරෙන් පියවර නැවත දරුවාට පහදා දෙන්න.
- 543 + 204 හි එකතුව ඉහත ක්‍රියාකාරකම කළ ආකාරයට ම ලබාගැනීමට අවස්ථාව ලබාදෙන්න.

## ක්‍රියාකාරකම 03

- පහත ගැටලුව දරුවාට ඉදිරිපත් කරන්න.
- එක් පාසලක සිටින ගැහැනු ළමයින් ගණන 167 කි. පිරිමි ළමයින් ගණන 215 කි. පාසලේ සිටින මුළු ළමයින් ගණන කීය ද?
- පිළිතුර ලබා ගැනීමට කුමක් කළ යුතුදැයි දරුවාගෙන් විමසන්න.
- සංඛ්‍යා දෙක එකතු කළ යුතු බව දරුවාට පහදා දෙන්න.
- සංඛ්‍යා පත්‍රිකාව මේසය මත තබන්න.
- 167 පළමුව නිරූපණය කළ යුතු බවත් එය සංඛ්‍යා පත්‍රිකාවේ නිරූපණය කිරීමට 100 කොටු සැලැස්ම, කොටු 10 කඩදාසි පටිය හා කුඩා කොටු යොදා ගත හැකි බව දරුවාට පහදා දෙන්න.

| සියයේ ඒවා | දහයේ ඒවා | එකේ ඒවා |
|---|---|---|
| | | |

- 167 සංඛ්‍යාව නිරූපණය කිරීමට දරුවාට අවස්ථාව ලබා දෙන්න.
- ඊට යටින් ස්ථානීය අගය අනුව 215 නිරූපණය කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- පිළිතුර ලබාගැනීමට එකතු කළ යුතු බව ද දරුවාට පවසන්න.
- ස්ථානීය අගය සලකමින් එකේ ඒවායින් ආරම්භ කර එකතු කරන අයුරු පෙන්වා දෙන්න.

එහි දී පහත කරුණු අවධාරණය කරන්න.

- එකේ ඒවා තීරයේ 7 සහ 5 එකතු කළ විට 12 වන බව.
- එකේ ඒවා තීරයේ 12 තැබිය නොහැකි බව.
- තනි කොටු සහිත කාඩ්පත් 10 ක්, කොටු 10 ක තනි කඩදාසි පටියකට හුවමාරු කළ යුතු බව.
- එකේ ඒවා තීරයෙහි තනි කොටු සහිත කාඩ්පත් 2 ක් ඉතුරුවන බව හා දහයේ ඒවා තීරයට තව කොටු 10 කඩදාසි පටියක් එකතු වන බව.
- දැන් මුළු 10 කඩදාසි පටි ගණන 8 වන බව.
- සියයේ ඒවා තීරයේ 100 කොටු සැලැස්ම 3 ක් ඇති බව.

- පිළිතුර 382 ලබාගත් ආකාරය නැවත කිහිපවරක් දරුවාට පහදා දෙන්න.

## ක්‍රියාකාරකම 04

- පත්‍රිකාව මේසය මත තබන්න.

| සියයේ ඒවා | දහයේ ඒවා | එකේ ඒවා |
|---|---|---|
| | | |

- 167+ 215 හි පිළිතුර කාඩ්පත් මගින් ලබාගැනීමට ද හැකි බව දරුවාට පහදා දෙන්න.
- ස්ථානීය අගය සලකමින් 167 සංඛ්‍යාව කාඩ්පත් තබමින් පත්‍රිකාවේ නිරූපණය කිරීමට දරුවාට කියන්න.
- ස්ථානීය අගය සලකමින් 215 සංඛ්‍යාව ඊට යටින් කාඩ්පත් ඇසුරෙන් තැබීමට දරුවාට කියන්න.
- පළමුව එකේ ඒවායින් ආරම්භ කර එකතු කරන අයුරු පෙර දැක්වූ ආකාරයට කිහිපවරක් පහදා දෙන්න.
- සකසා ගත් සංඛ්‍යා ලියූ කාඩ්පත් වරකට දෙක බැගින් ගෙන, එකතුව ලබා ගැනීමට දරුවාට අවස්ථාව ලබා දෙන්න.

## ක්‍රියාකාරකම 05

- පහත ගැටලුව දරුවාට ඉදිරිපත් කරන්න.
- බසයක ගැහැනු 12 දෙනෙක් ද පිරිමි 20 දෙනෙක් ද සිටිති.බසයේ සිටින මුලු මගීන් සංඛ්‍යාව කීයද?
- ගැටලුව කිහිපවරක් පවසන්න.
- ගැටලුව සිතා පිළිතුර දීමට දරුවාට උදවු කරන්න.
- ඉහත ආකාරයේ ගැටලු කීපයක් දරුවාට පවසා පිළිතුර ලබාගන්න.
- පහත ආකාරයේ ගැටලුවක් ඉදිරිපත් කර එය වගන්ති ලියා විසඳන ආකාරය පියවරෙන් පියවර දරුවාට පැහැදිලි කරන්න.
- වට්ටියක සුදු මල් 135 ක් ද, කහ මල් 118 ක් ද තිබේ. වට්ටියේ ඇති මුළු මල් ගණන කීය ද?

  සුදු මල් සංඛ්‍යාව = 135

  කහ මල් සංඛ්‍යාව = 118

  මුළු මල් සංඛ්‍යාව = 253

ගණිතය පෙළපොතේ පිටු අංක 49,50,51,52,53 අභ්‍යාස සඳහා මඟ පෙන්වන්න.